## ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

## කොළඹ

***

## පුවත්පත් නිවේදනය

### මහනුවර, පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය මහා විද්‍යාලය නවීකරණය කිරීම සඳහා ඉන්දීය සහාය - නව ගොඩනැගිලි සඳහා මුල්ගල් තැබේ

2018 අගෝස්තු මස 10 වන දින පැවති විශේෂ උත්සවයකදී මහනුවර දිස්ත්‍රික්කයේ පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය මහා විද්‍යාලයේ නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගරු තරංජිත් සිං සන්ධු මැතිතුමා, අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ගරු වී. රාධාක්‍රිෂණන් මැතිතුමා සහ මධ්‍යම පළාත් කෘෂිකර්ම සහ දමිළ අධ්‍යාපන අමාත්‍ය ගරු එම්. රාමේෂ්වරන් මැතිතුමා විසින් මුල්ගල් තබන ලදී.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, මධ්‍යම පළාත් සභා සාමාජිකයින්, ශ්‍රී ලංකා රජයේ නිලධාරීන්, විදුහල්පතිතුමා සහ ගුරුභවතුන්, පාසලේ සිසුන් සහ ආදි සිසුන් ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගී විය.

ශ්‍රී ලංකා රුපියල් මිලියන 96ක ඉන්දීය ප්‍රදානයක් යටතේ මෙම විදුහල නවීකරණය කෙරෙන අතර අලුතෙන් ඉදිකෙරෙන ගොඩනැගිලි සඳහා විද්‍යාගාර, දේශනා ශාලා සහ ගුරු නිවාස ඇතුළත් වේ. එසේම මෙම ව්‍යාපෘතිය යටතේ විදුහලේ දැනට පවතින ගොඩනැගිලිවල බිත්ති සහ තාප්ප අලුත්වැඩියා කිරීම, කාර්යාල සහ තොරතුරු තාක්ෂණ උපකරණ සහ ගෘහ භාණ්ඩ යනාදිය සැපයීම මෙන්ම විද්‍යාලයීය ක්‍රීඩා පිටිය සම්පූර්ණයෙන්ම නවීකරණය කිරීම සිදු කෙරේ.

මෙම ව්‍යාපෘතිය විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ජනතා කේන්ද්‍රීය සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකා රජය සමඟ සහයෝගිතාවයෙන් කටයුතු කිරීමට ඉන්දීය රජය දරන ප්‍රයත්නයේ කොටසකි. අධ්‍යාපන කේෂේත්‍රය තුළ සංවර්ධන සහයෝගීතාවය යටතේ ඉන්දීය රජය ශ්‍රී ලාංකේය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශ්‍රී ලංකාව සහ ඉන්දියාව තුළ අධ්‍යාපන කටයුතු සිදු කිරීම සඳහා ශිෂ්‍යත්ව ලබා දෙන අතර පාසල් ඉදිකිරීම සහ නවීකරණය කිරීම, පාසල් සඳහා  තොරතුරු තාක්ෂණ පහසුකම් සහ විද්‍යාගාර උපකරණ ලබාදීම, ඉංග්‍රීසි භාෂා සහ වෙනත් පුහුණු වැඩසටහන් පැවැත්වීම යනාදිය සිදු කරයි. ශ්‍රී  ලංකාවට සංවර්ධන ආධාර වශයෙන් ඉන්දියාව ඇමරිකානු ඩොලර් බිලියන 3 ක් පමණ ලබා දී ඇති අතර එයින් ඇමෙරිකානු ඩොලර් මිලියන 550 ක්ම නැවත නොගෙවිය යුතු ප්‍රදානයන් වේ

*****

කොළඹ
2018 අගෝස්තු 10